# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,407—1962 නොවැම්බර් 30 වැනි සිකුරාදා—1962.11.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 1661 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1661 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය | 1662 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 1663 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1665 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 1667 |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1670 |
| "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 485

අංකය : ඩී. 31/රෙක්ට්.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1962 ජූනි මස 29 වැනි දින සිට ලුතිනන් වශයෙන්—

උප ලුතිනන් සිසිල් ඔස්ටින් සොලමන්ස්, ලං.යු.යු.බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කජු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 23 වෙනිදා,
කොළඹ දීය.

11-1440

1962 අංක 486

අංකය : ඩී/වීඑෆ්/9/ඒ.

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන තිබෙන ඉල්ලා අස්වීමක්

1962 සැප්තැම්බර් මස 15 වැනි දින සිට, යුද්ධ හමුදාවේ, ලංකා ස්වේච්ඡා භට සේනාවේ පහත නම් සඳහන් නිලධාරියා සිය අධිකාරයෙන් ඉල්ලා අස්වීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ පිළිගෙන තිබේ.

ලුතිනන් එරික් රෙජිනෝල්ඩ් ක්‍රිෂ්ණරත්න, ලං.යු.සේ.ඛ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කජු. දියෙස්.
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 19 වෙනිදා,
කොළඹ දීය.

11-1221

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 487

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 57/59.

1962 ජූනි මස 1 වැනි දින සිට සිවිල් සේවක ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු මහතා වන සංරක්ෂක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 57/59.

1962 ජූනි මස 1 වැනි දින සිට සිවිල් සේවක බී. මහාදේව මහතා රබර් පාලක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 57/59.

1962 ජූනි මස 1 වැනි දින සිට සිවිල් සේවක ඩී. ඇම්. පී. බී. දසනායක මහතා පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 362/58.

1962 ජූනි මස 1 වැනි දින සිට සිවිල් සේවක ඒ. ටී. ඇම්. සිල්වා මහතා තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පාලක නිලධාරි වශයෙන් වැඩ බැලීමට.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 නොවැම්බර් මස 26 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

11—1445

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 488**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 25/46.

වී. එම්. කුමාරස්වාමි මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 නොවැම්බර් මස 24 වැනි දින සිට යාපනේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක එම්. 1790, 22801, 23024 සහ 23656 දරණ නඩු අසා අවසාන කිරීමට සහ තීන්දු දීමට යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (111).

එස්. ජෝකනාදන් මහතා 1962 නොවැම්බර් මස 18 වැනි දින සිට හෝ නැවත නියමයක් කරනතුරු, බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 3බී/60.

එස්. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. එන්. සී. තිරුවෙල්වම් මහතා 1962 දෙසැම්බර් මස 3 වැනි දින සිට 13 වැනි දින දක්වා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7. බී/56 (1).

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එෆ්. වී. එච්. ලා බ්‍රෝයි මහතා 1962 නොවැම්බර් මස 17 වැනි දින සිට 19 වැනි දින දක්වා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, නුවර එළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 34. ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු. වී. ආසිරිවාදම් මහතා 1962 නොවැම්බර් මස 16 වැනි දින රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68. සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 නොවැම්බර් මස 22 වැනි දින සිට 24 වැනි දින දක්වා අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරම සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 29. බී./61.

එස්. ඩී. ජයසුන්දර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 නොවැම්බර් මස 27 වැනි දින සිට 1962 දෙසැම්බර් මස 2 වැනි දින දක්වා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 29. බී/61(ඒ).

එස්. ඩී. ජයසුන්දර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. අමරසිංහ මහතා 1962 නොවැම්බර් මස 29 වැනි දින තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 12. ඒ/37.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1962 දෙසැම්බර් මස 8 වැනි දින සිට 13 වැනි දින දක්වා මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 1. සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 නොවැම්බර් මස 23 වැනි දින සහ නැවත 1962 දෙසැම්බර් මස 6 වැනි දින සිට 8 වැනි දින දක්වා ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ අනුරාධපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 51. ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. එච්. උදලාගම මහතා 1962 නොවැම්බර් මස 21 වැනි දින සිට 23 වැනි දින දක්වා කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49. ඒ./53.

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ටී. පී. සී. කැරන් මහතා 1962 නොවැම්බර් මස 14 වැනි දින මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්/27. ඒ/2/62.

මොහමඩ් හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1962 නොවැම්බර් මස 27 වැනි දින සිට 29 වැනි දින දක්වා කළුතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ/14/48.

ජේ. එන්. සී. තිරුවෙල්වම් මහතා 1962 නොවැම්බර් මස 24 වැනි දින සිට කොළඹ ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 25248 දරණ නඩුව අසා අවසාන කරන තෙක් සහ තීන්දුව දීම පිණිස කොළඹ (කොළඹ කොටුවෙහි) අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එම්. 5/54.

ඊ. එම්. මත්‍යපෙරනාම් සහ වී. සොමසුන්දරම් යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1962 නොවැම්බර් මස 28 වැනි දින සිට 1962 දෙසැම්බර් මස 3 වැනි දින දක්වා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එම්. 5/54.

ඊ. එම්. මත්‍යපෙරනාම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1962 දෙසැම්බර් මස 1 වැනි දින වවුනියා සහ මන්නාරම දිස්ත්‍රික්කවල දකුණු වවුනියාවේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ මාන්ටෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඊ. 1/48.

පී. කමාරනායගම් මහතා 1962 දෙසැම්බර් මස 1 වැනි දින හෝ නැවත නියමයක් කරනතුරු, ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලාම් සහ තම්පලාකාමම් පත්තුවල ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. එච්. සිරිවර්ධන මහතා 1962 නොවැම්බර් මස 17 වෙනි දින අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ සහ පාත බුලත්ගම සහ අතුළුගම් සහ පනාවල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා බෙලිගල් සහ කුරුවිටි කෝරලයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. ද නිකොලසින් මහතා 1962 නොවැම්බර් මස 15 වෙනි සහ 16 වෙනි දිනයන්හි අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ සහ පාත බුලත්ගම සහ අතුළුගම සහ පනාවල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා බෙලිගල් සහ කුරුවිටි කෝරලයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල් / ඒ. 10/62.

එච්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1962 දෙසැම්බර් මස 10 වැනි දින සිට 14 වැනි දින දක්වා මඩකලපු දිස්ත්‍රික්කයේ එරවූල්, පොරටිව් දකුණු මාන්මුනෙහි පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ උතුරු මාන්මුනෙයි පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල් / ඒ. 8/61.

ඒ. අලගයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඒ. සී. එම්. මීර සයිබෝ මහතා 1962 නොවැම්බර් මස 19 වැනි සහ 20 වැනි දිනයන්හි මඩකලපු දිස්ත්‍රික්කයේ කරවකු, නින්තාවූර්, සමන්තුරේ සහ වැව්ගම් පත්තුවල ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 29/57.

එස්. ඒ. සී. එම්. මීර සයිබෝ මහතා 1962 නොවැම්බර් මස 30 වැනි දින ක ් මුනේ ගම්බද උසාවියේ අංක කෝ./සීආර්එම්. 2348, කෝ/සීආර්එම්. 2394 සහ කෝ/සීආර්එම්. 2414 දරණ නඩු ඇසීමට මඩකලපු දිස්ත්‍රික්කයේ කරවකු, නින්තාවූර්, සමන්තුරේ සහ වැව්ගම් පත්තුවල ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 නොවැම්බර් 22 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

11-1347

---

## වෙනත් පත්කිරීම් ආදිය

**1962 අංක 489**

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය: ඒ. අයි. 6/4/61.

1962 නොවැම්බර් මස 9 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරනතුරු ගාළු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරලයේ වේරගොඩ, බටපොල, නොටගමුව, විදානආරච්චි කොට්ඨාශයන්හි හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ජේ. පී. ගුරුසිංහ මහතාද,

අංකය : ඒ. අයි. 17/2/51.

1962 නොවැම්බර් මස 12 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ බින්තැන්න කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට වී. හේවානායක මහතාද,

අංකය : ඒ. අයි. 17/3/60.

1962 ඔක්තෝබර් මස 23 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ, රිල්පොල-බෝගොඩ කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. බී. රත්නායක මහතාද,

අංකය : ඒ. අයි. 17/4/62.

1962 ඔක්තෝබර් මස 30 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ මහපලාත-බමරගම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ආර්. ඒ. ජේ. පෙරේරා මහතාද.

අංකය : ඒ. අයි. 17/2/60.

1962 ඔක්තෝබර් මස 23 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ, වියළුව කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. බී. රත්නායක මහතාද,

අංකය : ඒ. අයි. 17/5/62.

1962 ඔක්තෝබර් මස 23 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඩබ්ලිව්. වී. ඇම්. ඒක්කුබණ්ඩා මහතාද,

අංකය : ඒ. අයි. 17/3/62.

1962 ඔක්තෝබර් මස 23 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදගම්පත්තු කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ආර්. බී. පිටවෙල මහතාද,

අංකය : ඒ. අයි. 17/2/52.

1962 ඔක්තෝබර් මස 23 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඩබ්ලිව්. බී. හිඟුරුකඩුව මහතා ද,

අංකය : ඒ. අයි. 17/4/51.

1962 ඔක්තෝබර් මස 23 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ වැල්ලවාය කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඇස්. ඩබ්ලිව්. කුමාරසිංහ මහතාද,

අංකය : ඒ. අයි. 17/2/55.

1962 ඔක්තෝබර් මස 23 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ ඔයපළාත කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඩබ්ලිව්. එච්. පී. බස්නායක මහතාද,

අංකය : ඒ. අයි. 17/1/51.

1962 ඔක්තෝබර් මස 23 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ කුඹල්වෙල කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට පී. බී. රත්නායක මහතාද,

අංකය : අයි. එන්. කිව්. එල්./11/1/61.

1962 නොවැම්බර් මස 18 වැනි දින සිට එන් එම්. අහමඩ් ලෙව්වෙයි මහතා නැවත වැඩ භාරගන්නාතුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ, මුසලි උතුර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඒ. නයිනා මොහමඩ් මහතා ද,

අංකය : අයි. එන්. කිව්. එල්./6/1/58.

1962 නොවැම්බර් මස 26 වැනි දින සිට එන්. පී. ද ඉසෙඩ්. ජයතිලක මහතා නැවත වැඩභාරගන්නාතුරු ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිටි කෝරලේ, වැලිතර, ඌරගහ, කොස්ගොඩ, අම්බලන්ගොඩ, බලපිටිය කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඞී. ඒ. අස්සලආරච්චි මහතාද,

අංකය : අයි. එන්. කිව්. එල්./11/1/57.

1962 නොවැම්බර් මස 18 වැනි දින සිට ජේ. වී. පෙල්ඩානෝ මහතා නැවත වැඩ භාරගන්නාතුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ පේසා-ලෙයි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඊ. බී. පෙල්ඩානෝ මහතාද,

අංකය : අයි. එන්. කිව්. එල්./11/1/57.

1962 අගෝස්තු මස 25 වැනි දින සිට කේ. කේ. එස්. හබීබු මොහමඩ් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ, ඉරුක්කුලම්පිඩ්ඩි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. කේ. මාපිලෙයි මරික්කාර් මහතාද,

අංකය : අයි. එන්. කිව්. එල්./4/2/58.

1962 නොවැම්බර් මස 2 වැනි දින සිට එස්. බී. ඉලංකෝන් මහතා නැවත වැඩ භාරගන්නාතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැද්දේ කැටිය කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට පී. බී. මැදගොඩ මහතාද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-1444

---

**1962 අංක 490**

අංකය : ඒ. ජේ. 2/9/51.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

1. පී. එස්. ධම්බන්දු මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
2. ඒ. එච්. රයිසා මහතා කෑගලු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
3. එච්. එල්. එච්. ජයසුන්දර මහතා ගාලු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
4. එල්. ඒ. පොඩි අප්පුහාමි මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
5. කේ. එච්. ජී. ප්‍රැන්සිස් මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 26 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-1443

1962 අංක 491

## රාජ්‍ය ආරක්ෂක හා විදෙශ කටයුතු පිළිබඳ ගරු අමාත්‍යවරිය විසින් කෙරෙන පත් කිරීමයි

ඩබ්ලිව්. ඇම්. කරුණාරත්න මහතා, ආගමන හා විගමන නියෝජ්‍ය පාලක ලෙස ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1962 ඔක්තෝබර් 15 වන දින සිට මුළු දිවයිනේම ඉන්දියානු හා පකිස්තානු වැසියන් ලියාපදිංචි කිරීම පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස්වරයා ලෙස පත් කරන ලදී.

ඇන්. කථ්‍යු. දියෙස්,
ස්ථිර ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදෙශ කටයුතු අමාත්‍යාංශය.

1962.11.19 දින,
කොළඹදීය.

11-1214

---

1962 අංක 492

අංකය : ඊබී/ඒ-204/2.

අර්ථ නිරූපන ආඥාපණතේ දෙවන පරිච්ඡේදය 10බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්කිරීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ වැඩ බලන කාර්යාල සහකාර, ඇෆ්. ඩබ්ලිව්. රත්නසාර මහතා. සවකීය රාජකාරිවලට අතිරේකව, 1962 සැප්තැම්බර් මස 19 වැනි දින සිට, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්.

වවුනියාව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ වැඩබලන කායඹාල සහකාර, ටී. භගවදාස් මහතා, ස්වකීය රාජකාරි වලට අතිරේකව, 1962 සැප්තැම්බර් මස 24 වැනි දින සිට, මුලතිව්හි, සහකාර රේගු අයකැමි.

ඇම්. ජේ. පෙරේරා,
ස්ථිර ලේකම් වෙනුවට.

1962 නොවැම්බර් මස 14 වැනි දින,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

11-1193

---

1962 අංක 493

## ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ ආඥපනත (115 වැනි පරිච්ඡෙදය)

වර්ෂ 1947 (ස්වාධීනතා) රාජ්‍ය සභා ආඥා පනතේ 8 වන වගන්තිය යටතේ පනවනු ලැබ වර්ෂ 1948 පෙබරවාරි 5 වැනි දින අංක 9,828 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ප්‍රකාශයෙන් මඳ වශයෙන් සංශෝධනය කරනු ලැබූ ගෘහසේවකයින් ලියාපදිංචි කිරීම පිළිබඳ ආඥා පනතේ (115 වැනි පරිච්ඡෙදය) 3 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතුසේවා ඇමතිතුමන් විසින් ත්‍රිකුණාමලයේ ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ රෙජිස්ත්‍රාර් තැන වශයෙන් ඉන්ස්පෙක්ටර්, ඊ. එගොඩපිටිය මහතා වෙනුවට පොලිස් පරීක්ෂක ආර්. ආර්. ස්කොට් මහතා 1962 සැප්තැම්බර් මස 1 වැනි දින සිට පත් කරන ලදී.

වී. ඇස්. ඇම්. ද මෙල්,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් තැන.

1962 නොවැම්බර් මස 19 වෙනි දින,
කොළඹ, කම්කරු හා ජනසතු සේවා
අමාත්‍යාංශයේ දී ය.

11-1286

---

1962 අංක 494

## ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ ආඥපනත (115 වැනි පරිච්ඡෙදය)

වර්ෂ 1947 (ස්වාධීනතා) රාජ්‍ය සභා ආඥා පනතේ 8 වන වගන්තිය යටතේ පනවනු ලැබ වර්ෂ 1948 පෙබරවාරි 5 වැනි දින අංක 9,828 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනලද ප්‍රකාශයෙන් මඳ වශයෙන් සංශෝධනය කරනු ලැබූ ගෘහ සේවකයින් ලියා පදිංචි කිරීම පිළිබඳ ආඥා පනතේ (115 වැනි පරිච්ඡෙදය) 3 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් බදුල්ලේ ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ රෙජිස්ත්‍රාර් තැන වශයෙන් ඉන්ස්පෙක්ටර්, ඩී. ඩී. විජේසිංහ මහතා වෙනුවට පොලිස් පරීක්ෂක නීල් වීරසිංහ මහතා 1962 සැප්තැම්බර් මස 1 වැනි දින සිට පත් කරන ලදී.

වී. ඇස්. ඇම්. ද මෙල්,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් තැන.

1962 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ, කම්කරු හා ජනසතුසේවා
අමාත්‍යාංශයේ දී ය.

11-1287

---

1962 අංක 495

## දැන්වීමයි

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, සංවර්ධන අංශයේ, සහකාර අධ්‍යක්ෂ ආචාර්ය ආර්. සී. ද සිල්වා, 1962 නොවැම්බර් 12 වැනි දින සිට, ස්වකීය රාජකාරි වලට අතිරේකව, ආනයන හා අපනයන සහකාර පාලකවරයකු වශයෙන් පත් කරන ලදී.

කේ. අල්වාපිල්ලේ,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 19 වැනි දින,
කොළඹ දී ය.

11-1198/1

---

1962 අංක 496

## දැන්වීමයි

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ කාර්මික සහායක බී. සී. ද සිල්වා මහතා, 1962 නොවැම්බර් 12 වැනි දින සිට, ස්වකීය රාජකාරි වලට අතිරේකව, ආනයන හා අපනයන සහකාර පාලකවරයකු වශයෙන් පත් කරන ලදී.

කේ. අල්වාපිල්ලේ,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 19 වැනි දින,
කොළඹ දී ය.

11-1198/2

---

1962 අංක 497

## දැන්වීමයි

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ ආර්ථික සහකාර පී. එම්. ආර්. බී. තෙන්නකෝන් මහතා, 1962 නොවැම්බර් 12 වැනි දින සිට, ස්වකීය රාජකාරිවලට අතිරේකව, ආනයන හා අපනයන සහකාර පාලකවරයකු වශයෙන් පත් කරන ලදී.

කේ. අල්වාපිල්ලේ,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 19 වැනි දින,
කොළඹ දී ය.

11-1198/3

### 1962 අංක 498

## දැන්වීමයි

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්යශීල සහකාර සී. ඒ. ඩබ්ලිව්. ජයසේකර මහතා, 1962 නොවැම්බර් 12 වැනි දින සිට, ස්වකීය රාජකාරිවලට අතිරේකව, ආනයන හා අපනයන සහකාර පාලකවරයෙකු වශයෙන් පත් කරන ලදී.

කේ. අල්වාපිල්ලේ,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 19 වැනි දින,
කොළඹ දී ය.

11-1198/4

---

### 1962 අංක 499

## දැන්වීමයි

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, සී. එල්. වික්‍රමසිංහ මහතා, 1962 නොවැම්බර් 8 වැනි දින සිට, ස්වකීය රාජකාරිවලට අතිරේක ව, ආනයන හා අපනයන සහකාර පාලකවරයකු වශයෙන් පත් කරන ලදී.

කේ. අල්වාපිල්ලේ,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 19 වැනි දින,
කොළඹ දී ය.

11-1198/5

---

### 1962 අංක 500

## දැන්වීමයි

ඒකනායක මුදලිගේ පද්මලතා නන්දනසිරි අර්ත්තනායක මැහැත්මිය කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් වරියක වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

11-1407

---

### 1962 අංක 501

## දැන්වීමයි

මාරි තෙරේස් වික්‍රමනායක මෙනෙවිය කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් වරියක වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දීය.

11-1178

---

# ආණ්ඩුවේ නිවේදන

ඇල් ඩී—බී 29/61.

## 1961 අංකය 65 දරණ මුදල් පනත

1961 අංක 65 දරන මුදල් පනතේ 19 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් තමා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමතිවරයා විසින් මෙහි උපලේඛනයේ නියම කර ඇති ව්‍යාපාරයන්, යථෝක්ත වගන්තියේ කාර්යයන් සඳහා 1962 නොවැම්බර් 20 වැනි දින සිට අනුමත කර ඇත.

හ. ෂ. අමරසිංහ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 20 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

1. සීමාසහිත එලිෆන්ට් ලයිට් කෝපරේෂන්.
2. සීමාසහිත යුනිවර්සල් මෙට්ල් වර්ක් සමාගම.
3. සීමාසහිත මෝල්ඩෙක්ස්.
4. සීමාසහිත ඇලයිඩ් ඉන්ඩස්ට්‍රීස්.
5. ජේ. එච්. ආර්. තෝර්න්හිල් මහතා (ක්‍රිස්ල් ට්).
6. සීමාසහිත ටාඔස්.
7. සීමාසහිත ලිබ්රා ඉන්ඩස්ට්‍රීස්.
8. සීමාසහිත සිලෝන් සයිකල් ඉන්ඩස්ට්‍රීස්.
9. සීමාසහිත ලංකා ලයිට් නිට්ං කොම්පැණිය.
10. සීමාසහිත ඇසෝෂියේටඩ් රබර් ඉන්ඩස්ට්‍රීස්.
11. සෙකෝ බ්‍රෂ් කෝපරේෂන්.
12. සිලෝන් පින්ස් ඇන්ඩ් ක්ලිප්ස් මැනිපැක්චරි.
13. සීමාසහිත මැලිබන් බිස්කට් මැනිපැක්චරි.
14. සීමාසහිත සිලෝන් බල්බ්ස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්.
15. සීමාසහිත බිලිංස්.
16. සීමාසහිත ඕෂන් fප්‍රඩ්ස් ඇන්ඩ් ට්රේඩ්ස්.
17. සීමාසහිත සිලෝන් ග්ලාස් කොම්පැණිය.
18. සීමාසහිත ඇස්බැස්ටොස් සිමෙන්ට් ඉන්ඩස්ට්‍රීස්.
19. සීමාසහිත විලියම් කොන්පෙක්ෂනරි.
20. සීමාසහිත ඇසෝෂියේටඩ් බැටරි මැනිපැක්චර්ස්.
21. සීමාසහිත ඇලුමිනියම් ඉන්ඩස්ට්‍රීස්.
22. සීමාසහිත සිලෝන්පේපර් කොන්වර්ටර්ස්.
23. සීමාසහිත යුනයිටඩ් ගාර්මන්ට්ස් (ඉන්ටර් නැෂනල්).
24. සීමාසහිත හයිඩරාමනි (ඉන්ඩස්ට්‍රීස්).
25. සීමාසහිත ලංකා වීවිං මිල්ස්.
26. ලංකා ගමනාගමන මණ්ඩලය.
27. වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය.
28. සීමාසහිත එයා සිලෝන්.

11-1390

---

## 1939 අංක 48 දරණ බාලයින් හා තරුණයින් පිළිබඳ ආඥාපනත

1939 අංක 48 දරණ බාලයින් හා තරුණයින් පිළිබඳ ආඥාපනතේ 14 වැනි වගන්තියේ 2 වැනි උප වගන්තිය යටතේ නියම කරනු ලැබූ වයස 16 ට අඩු පුද්ගලයින් ස්වකීය නිවාසයේ තබා ගැනීම සඳහා සුදුසු වගකිවහැකි පුද්ගලයෙකු ලෙස ඈම්. සිරිවර්ධන මෙනෙවිය අනුමත කළ 1958 ජූනි 20 වැනි දින හා අංක 11,365 දරණ ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මෙයින් අවලංගු කරමි.

මෛත්‍රීපාල සේනානායක,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ ඇමති.

1962 නොවැම්බර් 21 දින,
කොළඹ.

11-1203

---

ගාල්ල සහ බලපිටිය අධිකරණ කොට්ඨාශයන්හි ක්වාසි වරයා ලෙස පත් කරන ලද, ගාල්ලේ රිච්මන් පාරේ අංක 45 හි පදිංචි අබ්දුල් හසන් ජමල්දීන් මහතාගේ පත්වීම මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ (115 වෙනි පරිච්ඡේදයේ) 12 (6) වෙනි වගන්තිය යටතේ ගරු කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් 1962 නොවැම්බර මස 16 වැනි දින සිට අවලංගු කරන ලද බව මෙයින් දන්වමි.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර මස 17 දින,
කොළඹ දීය.

11-131

## බන්ධනාගාර ආඥාපනත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උපලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තා, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලයකට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයකු වශයෙන්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඇස්. බී. කේ. තිලකරත්න,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1962 නොවැම්බර් 24 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශය.

උපලේඛනය

| I | II |
|---|---|
| වැලිකඩ සහ මැගසින් බන්ධනාගාර ... | ඊ. හේමා දබරේ මහතා |

11-1368

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

බේකරි කර්මාන්තය, ගොඩනැගිලි කර්මාන්තය, උළු සහ ගඩොල් නිපදවීමේ කර්මාන්තය, චිත්‍රපටි කර්මාන්තය, පොල් වැවීමේ කර්මාන්තය, ගුදිරි කොහු සහ ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය, ඉන්ජිනේරු කර්මාන්තය, අයිස් සහ සිසිල් බීම නිපදවීමේ කර්මාන්තය, ගිණිපෙට්ටි කර්මාන්තය, මෝටර් රථ ගමනාගමන කර්මාන්තය, මුද්‍රණ කර්මාන්තය, රබර් පිටරට යැවීමේ කර්මාන්තය සහ තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවන්හි සේව්‍ය නියෝජිත සාමාජිකයකුව සිට ඉල්ලා අස් වූ ඇම්. එච්. ආර්. ඇස්ට්බරි මහතා වෙනුවට එම පඩිපාලක සභාවන්හි පෙනී සිටීමට, පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතුසේවා ඇමතිතුමන් විසින් ඇන්. මහාදේව මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශයේ
අතිරේක ස්ථිර ලේකම්වරයා.

1962 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දිය.

11-1324

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

පඩිපාලක සභා ආඥාපනතේ (136 වෙනි අධිකාරය වන) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ :—

1. ඉල්ලා අස්වූ ඇම්. ජී. මැන්දිස් මහතා වෙනුවට රබර් වැවීමේ සහ තැනීමේ, පොල් වැවීමේ, පොල් නිපදවීමේ, රා අරක්කු හා විනාකිරි සහ මිනිරන් යන කර්මාන්ත පිළිබඳ පඩිපාලක සභාවන්හි සේවක සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට ඇන්. ෂන්මුගදාසන් මහතා ;

2. ඉල්ලා අස්වූ ඇම්. ජී. මැන්දිස් මහතා වෙනුවට ගිනිපෙට්ටි නිපදවීමේ සහ අයිස් හා සිසිල් බීම නිපදවීමේ කර්මාන්ත පිළිබඳ පඩිපාලක සභාවන්හි සේවක සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට කේ. කුලවීරසිංහම් මහතා ; සහ

3. ඉල්ලා අස්වූ ඇම්. ජී. මැන්දිස් මහතා වෙනුවට කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සේවක සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට වර්නන් ද ලිවේරා මහතා.

වී. ඇස්. ඇම්. ද මැල්,
ස්ථිර ලේකම්,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශය.

1962 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹදීය.

11-1319

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

මිණිරන්, මුද්‍රණ, රබර් පිටරට යැවීමේ සහ තේ පිටරට යැවීමේ කර්මාන්තයන් පිළිබඳ පඩිපාලක සභාවන්හි නම නියමකොට පත් කරන ලද සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම් මහතා වෙනුවට එම පඩිපාලක සභාවන්හි පෙනී සිටීමට, පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතුසේවා ඇමතිතුමන් විසින් ඇෆ්. ඩී. සී. විජේසිංහ මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1962 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දීය.

11-1328

---

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග මවිසින් අනුමත කරනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මවිසින් මෙයින් දනුම් දෙමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

1962 නොවැම්බර් 20 දින,
කොළඹදී ය.

උපලේඛනය

| දිනය | නියෝගය | නියෝගය නිකුත් කරන ලද ද්‍රව්‍ය | නියෝගය පලකරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 62.10.10 ... | සහකාර මිළ (ආහාර) පාලක, බදුල්ල දිස්ත්‍රික්කයේ ... | අතිරේක ආහාර ... | 62.10.18 වෙනිද 13,353 |
| 62.10.10 ... | සහකාර මිළ (ආහාර) පාලක, මොණරාගල දිස්ත්‍රික්කයේ ... | ,, ... | 62.10.18 වෙනිද 13,353 |
| 62.11. 2. ... | නියෝජ්‍ය මිළ (ආහාර) පාලක ... ... | ,, ... | 62.11. 2 වෙනිද 13,373 |
| 62.10.29 ... | සහකාර මිළ (ආහාර) පාලක, යාපනය දිස්ත්‍රික්කය ... | හාල් ... | 62.11. 6 වෙනිද 13,385 |
| 9.11.62 ... | නියෝජ්‍ය මිළ (ආහාර) පාලක ... ... | අතිරේක ආහාර ... | 62.11. 9 වෙනිද 13,388 |

11-1159

# ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

## ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

### 1960 ඔක්තෝබර් 1 දින සිට 1961 සැප්තැම්බර් 30 වැනි දින දක්වා කාල සීමාව පිළිබඳ කළමනාකාර මණ්ඩලයේ වාර්තාවයි

(1) **කළමනාකාර මණ්ඩලය.**—සමාලෝචනයට භාජනය වන වර්ෂය ඇතුලත කළමනාකාර මණ්ඩලයේ සාමාජිකත්වය පිළිබඳ කිසියම් වෙනසක් සිදු වී නැත. පත් කරන ලද සාමාජිකයා වශයෙන් ආර්. එස්. ජයවික්‍රම මහතා සිටියි. 1958 ඔක්තෝබර් 1 වැනි දින සිට මණ්ඩලයේ ලේකම් හා ගණකාධිකාරී ලෙස ක්‍රියා කළ බී. වී. ජෝර්ජ් මහතා වෙනුවට 1961 ජූලි 1 වැනි දින සිට ආර්. පොන්නම්පලම් මහතා එම තනතුරට පත්ව සිටියි.

(2) **දයකයෝ.**—1961 ජනවාරි 6 වැනි දින අංක 12,266 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද 1953 අංක 44 දරණ පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාමවැටුප් ආඥා පනත යටතේ පනවන ලද පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාමවැටුප් රෙගුලාසිවල 4 වැනි රෙගුලාසිය සංශෝධනය කිරීම හේතු කොට ගෙන සහතික පත් නොලත් ගුරුවරු විශාල සංඛ්‍යාවක් ගුරුවරුන්ගේ විශ්‍රාමවැටුප් ක්‍රමයේ දයක බව ලැබීමට සුදුස්සෝ වූහ. එසේ හෙයින් ඔවුන් ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමවැටුප් අරමුදලේ ද දයක බව ලැබීමට සුදුසු වූහ. 1961 සැප්තැම්බර් මස අගට සම්පූර්ණ දයක සංඛ්‍යාව 30,000 පමණ වුවද රෙගුලාසි 10 යටතේ පවුල පිළිබඳ විස්තර ප්‍රකාශන ලැබී ඇත්තේ 17,250 ගෙන් පමණි.

(3) **අයකිරීමේ ලේඛන.**—1957/58 වර්ෂයට පසු වර්ෂයන්හි අයකිරීමේ ලේඛන නියමිත ලෙස සසඳා බලා අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලැබී නැත. එම නිසා මිය ගිය ගුරුවරුන්ගේ වැන්දඹුවන්ට විශ්‍රාමවැටුප් ගෙවීම අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන අය සහතික පත්‍රයක් උඩ අනුමත කර අයකිරීම්වල නිරවද්‍යතාවය ලේඛන ලද විටක සොයා බැලීමට යොද ගෙන ඇත. මේ ක්‍රමය ප්‍රවේසම් සහගත නො වුවද, වෙන කළ හැකි අන්කිසි ක්‍රමයක් නොමැත. එසේ නොවුවහොත් මියගිය දයකයින්ගෙන් යැපුනවුන්ට අසීමිත ප්‍රමාද වලට හා අපහසුකම්වලට යටත් වීමට සිදු වේ.

(4) **අරමුදල තක්සේරු කිරීම.**—1956 සැප්තැම්බර් 30 වැනි දිනට යෙදී ඇති අරමුදලේ පංච වාර්ෂික තක්සේරුව පිළිබඳ සංඛ්‍යා ලේඛන ජීවනසංඛ්‍යා නිලධාරියා වෙත 1959 දෙසැම්බර් මාසයේ යවන ලදුව දැනට ඔහුගේ වාර්තාව අපේක්ෂාවෙන් සිටිනු ලැබේ. 1961 සැප්තැම්බර් 30 වැනි දිනට යෙදෙන අරමුදලේ දෙවැනි ජීවනාංකිත තක්සේරුව දැන් නියමිතව ඇති ද 1960/61 දක්වා අයකිරීමේ ලේඛන හා සුදුසුකම් ඇති හැම ගුරුවරයාගේම ප්‍රකාශ පත් ලබා ගෙන දයකයන්ගේ ගණන් පත්‍ර සකස් නොකර අරමුදල තක්සේරු කිරීමෙන් බලාපොරොත්තු ප්‍රතිඵල නොලැබේ.

(5) **හිමිකම් පෑම.**—සමාලෝචනය වන කාලසීමාව තුල විශ්‍රාම වැටුප් 56 ක් අනුමත කරමින් 1961 සැප්තැම්බර් 30 දක්වා අනුමත කර ඇති මුළු විශ්‍රාම වැටුප් ගණන 442 විය. ප්‍රථම දශ වර්ෂය ඇතුලත අනුමත කරන ලද විශ්‍රාම වැටුප් වෙනුවෙන් වාර්ෂික වගකීම රු. 92,500 ක් පමණ වේ.

මේ කාල සීමාව තුල රෙගුලාසි 27 සහ 28 යටතේ අනුමත කරන ලද දයක මුදල් ආපසු ගෙවීම් 28 ක් වන අතර 1961 සැප්තැම්බර් 30 දින දක්වා අනුමත කර ඇති ආපසු ගෙවීම් මුළු ගණන 204 කි.

**ආයතන වියදම් ආදිය.**—මේ අවුරුද්ද වෙනුවෙන් අරමුදලට රජයෙන් ගෙවන ලද දයක මුදල් රු. 10,46,570·43 වන අතර පසුගිය වර්ෂයේ දයක මුදල් වෙනුවෙන් තවත් රු. 2,242·90 ගෙවන ලදී. ගිය මුදල් වර්ෂයේ මේ වෙනුවෙන් ගෙවන ලද මුදල රු. 9,89,501·60 කි. අරමුදල පාලනය පිළිබඳ අනියම් වියදම් වන ආයතන වියදම් ආදිය සහ අරමුදල යටතේ දෙනු ලබන විශ්‍රාම වැටුප් පිළිබඳ ජීවනාධාර දීමනා ද රජය මගින් ගෙවනු ලැබේ.

**මුදල් යෙදවීම.**—1953 අංක 44 දරණ පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ 5(1) වැනි වගන්තියේ ප්‍රකාර අරමුදලේ වැඩිමනත් මුදල්, මුදල් භාරකාර ආඥා පනතේ 87 වැනි පරිච්ඡෙදයේ 20 වැනි වගන්තියේ නියමිත ඇප සඳහා යොදවනු ලැබේ. රු. 25,33,800·00 වටිනා 4¼% ලංකාණ්ඩුවේ ණය මුදල් සඳහා මේ අවුරුද්ද ඇතුලත යොදන මුළු මුදල රු. 25,33,726 කි.

1961 සැප්තැම්බර් 30 දිනට අවසන් වන දස වර්ෂය ඇතුලත රු. 1,30,64,100 වටිනා රජයේ කොටස් මුදල් ගැනීම සඳහා යොදන ලද මුළු මුදල රු. 1,30,96,083 කි. මේවායේ වාර්ෂික පොලී ප්‍රමාණයන් 2½% හා 4¼% පමණ වේ. මේ මුදල් යෙදවීම් සඳහා ලැබෙන වාර්ෂික පොලී මුදල රු. 4,53,713 පහත දක්වෙන පරිදි ය:—

| ගත් මිළ රු. | ශ. | | කොටස්වල වටිනාකම රු. | ශ. | | පොලී ප්‍රමාණය | | වාර්ෂික පොලිය රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 5,176 | 0 | ... | 6,000 | 0 | ... | 2½% | ... | 150 | 0 |
| 31,89,869 | 75 | ... | 31,94,300 | 0 | ... | 3% | ... | 95,829 | 0 |
| 26,01,003 | 0 | ... | 26,01,000 | 0 | ... | 3¼% | ... | 84,532 | 50 |
| 47,66,308 | 25 | ... | 47,29,000 | 0 | ... | 3½% | ... | 1,65,515 | 0 |
| 25,33,726 | 0 | ... | 25,33,800 | 0 | ... | 4 % | ... | 1,07,686 | 50 |
| 1,30,96,083 | 0 | | 1,30,64,100 | 0 | | | | 4,53,713 | 0 |

1961 සැප්තැම්බර් 30 වැනි දිනට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්තුමා ලඟ ඉතිරිව තිබූ රු. 6,72,646.30 මුදල ඊට පසු 4¼% ලංකාණ්ඩුවේ ණය මුදල් සඳහා යොදවන ලදී.

**පොලිය.**—ගිය වර්ෂයේ පොලිය සඳහා ලද මුදල වන රු. 2,84,082.21 වෙනුවට මේ වර්ෂයේ ලද මුළු පොලී මුදල රු. 3,71,875·19 කි. මීළඟ මුදල් වර්ෂය ඇතුලත ලැබීමට ඇති මුළු පොලී මුදල රු. 5,00,000 වේයැයි ගණන් බලා ඇත.

**ගණන් හිලවු.**—1961 සැප්තැම්බර් 30 වැනි දිනට අරමුදලේ අයවැය පිළිබඳ වාර්තාවක් ද වර්ෂයේ මුදල් යෙදවීම් හා 1961 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වූ දස වර්ෂය පිළිබඳ එක් වූ අයවැය වාර්තාවක් හා 1961 සැප්තැම්බර් 30 වැනිදට අරමුදලේ වත්කම පිළිබඳ වාර්තාවක් විධි වූ පරිදි ඔඩිටර් ජනරාල් විසින් පරීක්ෂා කරන ලදුව මෙහි පහත දක්වේ.

සභාපති : සී. බාලසිංහම්.

සාමාජිකවරු:
- ඒ. සී. අලස්.
- එස්. එෆ්. ද සිල්වා.
- පී. ඩී. උඩුවෙල.
- එන්. සබාරත්නම්.

ආර්. පොන්නම්පලම්,
ලේකම් හා ගණකාධිකාරී.

## ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමවැටුප් අරමුදල

**1961 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන මුදල් වර්ෂය පිළිබඳ අයවැය වාර්තාව**

**අය**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඉතිරි වී ඉදිරියට ගෙනෙන ලදුව ... ... | | 8,06,340 29 |
| දයක මුදල් ... ... ... | | 10,47,368 03 |
| දයක මුදල් (රෙගුලාසි 21 යටතේ) ... ... | | 913 55 |
| රජයෙන් ලැබුණු ආධාර මුදල්— ... | | |
| 1959-60 ... ... | 2,242 90 | |
| 1960-61 ... ... | 10,46,570 43 | |
| | | 10,43,813 33 |
| යොදවා ඇති මුදලේ පොලිය ... ... | | 3,71,875 19 |
| විවිධ අය ... ... ... | | 2,654 45 |
| ආපසු ලැබූ යෙදවූ මුදල් ... ... | | 25,300 0 |
| | | 33,03,264 84 |

**වැය**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| මුදල් යෙදවීම ... ... ... | | 25,33,726 0 |
| විශ්‍රාම වැටුප් ... ... ... | | 87,821 30 |
| ආපසු ගෙවීම්— | | |
| රෙගුලාසි 27 සහ 28 යටතේ ... | 5,718 09 | |
| වැරදි ලෙස අය වූ මුදල් ... | 330 56 | |
| | | 6,048 65 |
| විවිධ වැය ... ... ... | | 3,022 59 |
| භා.නි/ලේ. තුමා ළඟ ඉතිරි මුදල් ... ... | | 6,72,646 30 |
| | | 33,03,264 84 |

සංලෂායය.—අරමුදල යටතේ විශ්‍රාම වැටුප් අනුව ගෙවන ලද ජීවනාධාර හා විශෙෂ ජීවනාධාර වෙනුවෙන් ශුද්ධ වියදම් පිළිවෙලින් රු. 1,72,088·84 ක් සහ රු. 97,057.97 ක් විය. මෙම ගෙවීම් 1960–61 වර්ෂයේ ශීර්ෂ 33, වැය ශීර්ෂ 2, උප ශීර්ෂ 2 කින් ගෙවන ලදී.

ආර්. පොන්නම්පලම්,
ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ
කළමනාකාර මණ්ඩලයේ ලේකම් හා ගණකාධිකාරී.
1961 දෙසැම්බර් 29 වන දින කොළඹදීය.

සී. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා ගුරුවරුන්ගේ වැන්දඹු
හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ සභාපති.

1954 ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමවැටුප් අරමුදලේ 6(1) රෙගුලාසි අනුව ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමවැටුප් අරමුදලේ ගණන් හිලවු වාර්තාව මගේ පරිපාලනය යටතේ පරීක්ෂා කරන ලදී. කළමනාකාර මණ්ඩලයේ සභාපති වෙත යවන ලද 1962 සැප්තැම්බර් 27 වැනි දින අංක පී–5/ටී–18 දරණ මගේ වාර්තාවේ සඳහන් අදහස්වලට යටත්ව 1961 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන මුදල් වර්ෂය පිළිබඳ ඉහත සඳහන් අයවැය වාර්තාව එකී දිනට අවසන් වන මුදල් වර්ෂය පිළිබඳ මණ්ඩලයේ නිවැරදි අයවැය වාර්තාවක් යනු මගේ කල්පනාවයි.

ඩී. ඇස්. ද සිල්වා,
ඔඩිටර් ජනරාල් වෙනුවට.

1962 සැප්තැම්බර් 27 වන දින,
ගණන් පරීක්ෂණ කාර්යාලයේදී ය.
කොළඹ 7.

## ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

**1961 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන කාලය පිළිබඳ අය වැය සමුච්චිත වාර්තාවයි**

**අය**

| අය | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1960.9.30 දක්වා දයක මුදල් ... | 53,45,235 07 | |
| 1960.10.1 සිට 1961.9.30 දක්වා දයක මුදල් ... ... | 10,47,368 03 | |
| | | 63,92,603 10 |
| 1960.9.30 දක්වා රෙගුලාසි 21 යටතේ දයක මුදල් ... ... | 3,758 27 | |
| 1960.10.1 සිට 1961.9.30 දක්වා දයක මුදල් ... ... | 913 55 | |
| | | 4,671 82 |
| 1960.9.30 දක්වා රජයේ ආධාර මුදල් ... | 53,42,902 97 | |
| 1960.10.1 සිට 1961.9.30 දක්වා රජයේ ආධාර මුදල් ... ... | 10,48,813 33 | |
| | | 63,91,716 30 |
| 1960.9.30 දක්වා මුදල් යෙදවීම්වල පොලිය ... ... | 9,97,155 63 | |
| 1960.10.1 සිට 1961.9.30 දක්වා මුදල් යෙදවීම්වල පොලිය ... | 3,71,875 19 | |
| | | 13,69,030 82 |
| 1960.9.30 දක්වා වැරදි ලෙස අයවූ දයක මුදල් සහ බැර කිරීම ... | 79,975 74 | |
| 1960.10.1 සිට 1961.9.30 දක්වා අයවූ දයක මුදල් සහ බැර කිරීම ... | 2.654 45 | |
| | | 82,630 19 |
| ව්‍යාපාර මුදලේ කාලසීමාව අවසානයේදී යෙදවූ මුදලට වඩා වැඩියෙන් ආපසු ලත් මුදල ... ... | | 5,703 83 |
| | | 1,42,46,356 06 |

**වැය**

| වැය | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1960.9.30 දක්වා ගෙවන ලද විශ්‍රාම වැටුප් | 2,76,937 66 | |
| 1960.10.1 සිට 1961.9.30 දක්වා ගෙවන ලද විශ්‍රාම වැටුප් ... ... | 87,821 30 | |
| | | 3,64,758 96 |
| 1960.9.30 දක්වා රෙගුලාසි 27 සහ 28 යටතේ ආපසු ගෙවීම් ... | 23,243 23 | |
| 1960.10.1 සිට 1961.9.30 දක්වා ආපසු ගෙවීම් ... ... | 5,718 09 | |
| | | 28,961 32 |
| 1960.9.30 දක්වා වැරදි ලෙස අයවූ මුදල් ආපසු ගෙවීම් ... ... | 80,553 33 | |
| 1960.10.1 සිට 1961.9.30 දක්වා ආපසු ගෙවීම් ... ... | 3,353 15 | |
| | | 83,906 48 |
| 1960.9.30 දක්වා මුදල් යෙදවීම් ... | 1,05,62,357 0 | |
| 1960.10.1 සිට 1961.9·30 දක්වා මුදල් යෙදවීම් ... ... | 25,33,726 0 | |
| | | 1,30,96,083 0 |
| ඉතිරි ... ... | | 6,72,646 30 |
| | | 1,42,46,356 06 |

**වත්කම්**

| | | රු. | ශ. |
|---|---|---|---|
| රජයේ ණයකරවල යෙදවූ මුදල් | ... | ... 1,30,96,083 | 0 |
| භා.නි./ලේ. කුමා ලභ ඉතිරි | ... | ... 6,72,646 | 30 |
| | | 1,37,68,729 | 30 |

බී. වී. ජෝර්ජ්,
ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ ලේකම් හා ගණකාධිකාරී.

සී. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ සභාපති.

1962 ජූනි 8 වන දින,
කොළඹදීය.

1962 සැප්තැම්බර් 27 වන දින අංක පී-5, වී-18 දරණ මගේ වාර්තාවේ අඩංගු ඇඟවීම්වලට යටත්ව මෙය පරීක්ෂා කර නිවැරදි බැව් දක්නා ලදී.

ඩී. ඇස්. ද සිල්වා,
ඔඩිටර් ජනරාල්තුමා වෙනුවට.

1962 සැප්තැම්බර් 27 වන දින,
කොළඹ 7,
ගණන් පරීක්ෂණ කාර්යාලයේදී.

**1960–61—මුදල් යෙදවීම්**

| දිනය | ව්‍යාපාර මුදල පිළිබඳ විස්තර | ප්‍රකාශන අගය රු. | ශ. | වෙළඳ මිල | ගත් මිල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| 1960.11.1 | ... 1981–85, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය ... ... | ... 6,00,000 | 0 | ... මුල් අගය | ... 6,00,000 | 0 |
| 1960.12.1 | ... 1981–85, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය (''බී'' වර්ගය) ... | ... 1,50,000 | 0 | ... ,, | ... 1,50,000 | 0 |
| 1961.1.16 | ... 1982–86, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය ... ... | ... 2,50,000 | 0 | ... ,, | ... 2,50,000 | 0 |
| 1961.2.22 | ... 1982–86, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය (''බී'' වර්ගය) ... | ... 2,00,000 | 0 | ... ,, | ... 2,00,000 | 0 |
| 1961.5.20 | ... 1982–86, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය (''සී'' වර්ගය) ... | ... 5,00,000 | 0 | ... ,, | ... 5,00,000 | 0 |
| 1961.7.1 | ... 1982–86, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය (''ඩී'' වර්ගය) ... | ... 1,25,000 | 0 | ... ,, | ... 1,25,000 | 0 |
| 1961.7.6 | ... 1982–86, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය ... ... | ... 8,500 | 0 | ... 99 | ... 8,426 | 0* |
| 1961.7.14 | ... 1982–86, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය (''ඩී'' වර්ගය) ... | ... 1,75,000 | 0 | ... මුල් අගය | ... 1,75,000 | 0 |
| 1961.8.1 | ... 1982–86, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය (''ඊ'' වර්ගය) ... | ... 25,300 | 0 | ... ,, | ... 25,300 | 0† |
| 1961.9.7 | ... 1982–86, $4\frac{1}{4}$% ලංකාණ්ඩුවේ ණය (''එෆ්'' වර්ගය) ... | ... 5,00,000 | 0 | ... ,, | ... 5,00,000 | 0 |
| | | 25,33,800 | 0 | | 25,33,726 | 0 |

* පැවරුම් ගාස්තු හා තැරැව් ගාස්තු වශයෙන් රු. 11ක් ඇතුලත් වේ.

† නැවත මුදල් යෙදවීමකි. මුල් ව්‍යාපාර මුදලේ වටිනාකම රු. 25,541.75කි.

ආර්. පොන්නම්පලම්,
ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ ලේකම් හා ගණකාධිකාරී.

සී. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ සභාපති.

1961 දෙසැම්බර් 29 වන දින,
කොළඹදී ය.

## ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

**1961 සැප්තැම්බර් 30 වන දින තෙක් වත්කම් පිළිබඳ ප්‍රකාශය**

**(අ) රජයේ ණය**

| අංකය | විස්තර | ප්‍රකාශන අගය රු. | ශ. | ගත් මිල රු. | ශ. | 1961 සැප්තැම්බර් 30 වන දිනට වෙළඳ මිල | සහ මිල කළ හැකි වටිනාකම රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | 1967–72, $2\frac{1}{2}$% ජාතික සංවර්ධන ණය ... ... | 6,000 | 0 | ... 5,176 | 0 | ... $91\frac{11}{16}$ | ... 5,501 | 25 |
| 2. | 1973–78, 3 % ණය ... ... ... | 38,000 | 0 | ... 35,961 | 50 | ... $90\frac{1}{4}$ | ... 34,295 | 0 |
| 3. | 1972–77, 3 % ණය ... ... ... | 81,300 | 0 | ... 78,282 | 25 | ... $90\frac{15}{16}$ | ... 73,932 | 19 |
| 4. | 1969–74, 3 % ශ්‍රී ලංකා ණය ... ... ... | 10,00,000 | 0 | ... 10,00,626 | 0 | ... $95\frac{3}{16}$ | ... 9,51,875 | 0 |
| 5. | 1969–72, 3 % ණය ... ... ... | 5,00,000 | 0 | ... 5,00,000 | 0 | ... $96\frac{5}{16}$ | ... 4,81,562 | 50 |
| 6. | 1970–73, 3 % ණය ... ... ... | 2,25,000 | 0 | ... 2,25,000 | 0 | ... $96\frac{3}{16}$ | ... 2,16,421 | 87 |
| 7. | 1970–73, 3 % ලංකා සංවර්ධන ණය ... ... | 1,00,000 | 0 | ... 1,00,000 | 0 | ... $95\frac{3}{4}$ | ... 95,750 | 0 |
| 8. | 1975–80, $3\frac{1}{4}$% ණය ... ... ... | 2,35,000 | 0 | ... 2,35,000 | 0 | ... $90\frac{3}{8}$ | ... 2,12,381 | 25 |
| 9. | 1976–81, $3\frac{1}{4}$% ණය ... ... ... | 1,00,000 | 0 | ... 1,00,000 | 0 | ... $90\frac{1}{4}$ | ... 90,250 | 0 |
| 10. | 1973–77, $3\frac{1}{4}$% ණය ... ... ... | 2,16,000 | 0 | ... 2,16,003 | 0 | ... 94 | ... 2,03,040 | 0 |
| 11. | 1974–78, $3\frac{1}{4}$% ණය ... ... ... | 2,00,000 | 0 | ... 2,00,000 | 0 | ... $93\frac{11}{16}$ | ... 1,87,375 | 0 |
| 12. | 1974–78, $3\frac{1}{4}$% ණය (බී. වර්ගය) ... ... ... | 7,00,000 | 0 | ... 7,00,000 | 0 | ... $92\frac{7}{8}$ | ... 6,50,125 | 0 |
| 13. | 1975–79, $3\frac{1}{4}$% ණය (බී. වර්ගය) ... ... ... | 4,00,000 | 0 | ... 4,00,000 | 0 | ... $92\frac{7}{16}$ | ... 3,69,750 | 0 |
| 14. | 1964–69, $3\frac{1}{2}$% ජාතික ණය ... ... ... | 10,62,400 | 0 | ... 10,92,692 | 75 | ... $101\frac{3}{4}$ | ... 10,80,992 | 0 |
| 15. | 1979–83, $3\frac{1}{2}$% ණය ... ... ... | 1,00,000 | 0 | ... 1,00,000 | 0 | ... $91\frac{9}{16}$ | ... 91,562 | 50 |
| 16. | 1980–84, $3\frac{1}{2}$% ණය ... ... ... | 9,36,600 | 0 | ... 9,36,600 | 0 | ... $90\frac{5}{8}$ | ... 8,48,793 | 75 |
| 17. | 1980–84, $3\frac{1}{2}$% ණය (බී. වර්ගය) ... ... ... | 2,00,000 | 0 | ... 2,00,000 | 0 | ... $90\frac{7}{16}$ | ... 1,80,875 | 0 |
| 18. | 1975–79, $3\frac{1}{2}$% ණය ... ... ... | 3,00,000 | 0 | ... 3,00,000 | 0 | ... 95 | ... 2,85,000 | 0 |
| 19. | 1976–80, $3\frac{1}{2}$% ණය ... ... ... | 11,00,000 | 0 | ... 11,00,000 | 0 | ... $94\frac{1}{2}$ | ... 10,39,500 | 0 |
| 20. | 1976–80, $3\frac{1}{2}$% ණය (බී. වර්ගය) ... ... ... | 2,00,000 | 0 | ... 2,00,000 | 0 | ... $94\frac{3}{8}$ | ... 1,88,750 | 0 |

අ. රජයේ ණය (සම්බන්ධයි)

| අංකය | විස්තර | ප්‍රකාශන අගය රු. | ශ. | ගත් මිල රු. | ශ. | 1961 සැප්තැම්බර් 30 වැනි දිනට වෙළඳමිල සහ මිළ කළ හැකිවටිනාකම | රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| 21. | 1976–80, 3½% ණය (සී. වර්ගය) ... ... ... | 1,75,000 | 0 | 1,75,000 | 0 | 94¼ ... | 1,64,937 | 50 |
| 22. | 1976–80, 3½% ණය (ඩී. වර්ගය) ... ... ... | 1,50,000 | 0 | 1,50,000 | 0 | 94 1/16... | 1,41,093 | 75 |
| 23. | 1981–85, 4½% ණය ... ... ... | 6,00,000 | 0 | 6,00,000 | 0 | 100¾ ... | 6,04,500 | 0 |
| 24. | 1981–85, 4½% ණය (බී. වර්ගය) ... ... ... | 1,50,000 | 0 | 1,50,000 | 0 | 100 5/8 ... | 1,50,937 | 50 |
| 25. | 1982–86, 4½% ණය ... ... ... | 2,58,500 | 0 | 2,58,426 | 0 | 100 7/16... | 2,59,630 | 94 |
| 26. | 1982–86, 4¼% ණය (බී. වර්ගය) ... ... ... | 2,00,000 | 0 | 2,00,000 | 0 | 100 7/16... | 2,00,875 | 0 |
| 27. | 1982–86, 4½% ණය (සී. වර්ගය) ... ... ... | 5,00,000 | 0 | 5,00,000 | 0 | 100 5/16... | 5,01,562 | 50 |
| 28. | 1982–86, 4½% ණය (ඩී. වර්ගය) ... ... ... | 3,00,000 | 0 | 3,00,000 | 0 | 100⅛ ... | 3,00,375 | 0 |
| 29. | 1982–86, 4½% ණය (ඊ. වර්ගය) ... ... ... | 25,300 | 0 | 25,300 | 0 | 100⅛ ... | 25,331 | 62 |
| 30. | 1982–86, 4½% ණය (එෆ්. වර්ගය) ... ... | 5,00,000 | 0 | 5,00,000 | 0 | 100 ... | 5,00,000 | 0 |
| (ආ) | ණයකර | | | | | | | |
| 31. | 1965–68, 3 % උගස් බැංකු ... ... ... | 7,50,000 | 0 | 7,50,000 | 0 | 99⅛ ... | 7,43,437 | 50 |
| 32. | 1969–71, 3 % ජාතික නිවාස ... ... ... | 85,000 | 0 | 85,000 | 0 | 97 7/8 ... | 83,193 | 75 |
| 33. | 1970–73, 3 % උගස් බැංකු ... ... ... | 1,65,000 | 0 | 1,65,000 | 0 | 96 ... | 1,58,400 | 0 |
| 34. | 1970–73, 3 % ජාතික නිවාස ... ... ... | 1,00,000 | 0 | 1,00,000 | 0 | 95 7/8 ... | 95,875 | 0 |
| 35. | 1970–73, 3 % ජාතික නිවාස (බී. වර්ගය) ... ... | 1,50,000 | 0 | 1,50,000 | 0 | 95½ ... | 1,43,250 | 0 |
| 36. | 1970–72, 3¼% ජාතික නිවාස ... ... ... | 5,00,000 | 0 | 5,00,000 | 0 | 98 15/16 | 4,94,687 | 50 |
| 37. | 1976–81, 3½% ජාතික නිවාස ... ... ... | 50,000 | 0 | 50,000 | 0 | 89 7/16... | 44,718 | 75 |
| 38. | 1974–78, 3½% ජාතික නිවාස ... ... ... | 2,00,000 | 0 | 2,00,000 | 0 | 93½ ... | 1,87,000 | 0 |
| 39. | 1969–71, 3½% ජාතික නිවාස ... ... ... | 5,05,000 | 0 | 5,12,015 | 50 | 102⅛ ... | 5,15,731 | 25 |
| | | 1,30,64,100 | 0 | 1,30,96,083 | 0 | | 1,26,03,269 | 87 |

ආර්. පොන්නම්පලම්,
ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ ලේකම් හා ගණකාධිකාරී.

සී. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ සභාපති.

1961 දෙසැම්බර් 29 වන දිනය,
කොළඹදී ය.
11–1195

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සමුපකාර සමිති පිළිබඳ ආඥා පනත (124 වෙනි අධිකාරය)

### සමුපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම

සමුපකාර සමිති පිළිබඳ ආඥා පණතේ 52 (2) වෙනි වගන්තිය යටතේ පහත සඳහන් සමුපකාර සමිති ඒ එක එක ඉදිරියෙහි සඳහන් කර තිබෙන දිනයන්හි වසා දමන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ ;—

| | සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|---|
| 1. | සීමාසහිත ඉහල කරගහමුණ සමුපකාර වෙළඳ සැල් සමිතිය ... ... | 62. 7. 4 |
| 2. | සීමාසහිත හොරවින්න සමුපකාර ගොවි සමිතිය ... ... ... | 62. 8.27 |
| 3. | සීමාසහිත මිල්ලතේ සමුපකාර බඩු ගබඩා සමිතිය ... ... ... | 62. 9. 3 |
| 4. | සීමාසහිත පෝද්දිවෙල සමුපකාර කඩ සමිතිය ... ... ... | 62. 9.18 |
| 5. | සීමාසහිත එගොඩගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 62. 9.27 |
| 6. | සීමාසහිත වඩුගොඩ ගොවි ද්‍රව්‍ය නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... | 62.10.10 |
| 7. | සීමාසහිත පන්ලියද්ද විවිධ සේවා සමුපකාර සමිතිය ... ... ... | 62.10.10 |
| 8. | සීමාසහිත මන්දණ්ඩාවල සමුපකාර කඩ සමිතිය ... ... ... | 62.10.11 |
| 9. | සීමාසහිත උතුරු කොලින්ජාඩිය සමුපකාර කඩ සමිතිය ... ... | 62.10.22 |

රෝ. සමරසේකර,
නියෝජ්‍ය සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්තැන.

1962.11.16,
කොළඹ තැ. පෙ. 419,
සමුපකාර දෙපාර්තමේන්තුව.
11–1175

## ප්‍රකාශනයයි

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත නැගෙනහිර ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ පූලියන්කුලම, සාලියපුරය, උකුලන්කුලම හා රඹාවැව ගම්වල ගවයින් අතර "මුව සහ කුර' නැමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : රඹාවැව-පරසන්ගස්වැව පාර ; දකුණට : අනුරාධපුර-මිහින්තලේ පාර ; නැගෙනහිරට : මිහින්තලේ-රඹා වැව පාර ; බස්නාහිරට : මල්වතු ඔය.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර කුරුන්දන්කුලම පශු වෛද්‍ය තැනගෙන් හෝ නුවරගම් පළාත නැගෙනහිර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායාීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැන.

1962 නොවැම්බර් මස 22 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිගේ කායාීලයේදී ය.

11-1326/1

---

## ප්‍රකාශනයයි

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත බටහිර කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ නුවරගම් කෝරළයේ කටුකැලියාව ගමේ ගවයින් අතර "මුව සහ කුර" නැමති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : පහළ හල්මිල්ලෑව ගම ; දකුණට : අනුලා මාවත ; නැගෙනහිරට : පෙරමියන්කුලම ගම ; බස්නාහිරට : ඉහළ හම්මිල්ලෑව ගම.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර තහනම් කරන ලද, ඉහත ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර අනුරාධපුර පශු වෛද්‍ය තැනගෙන් හෝ නුවරගම් පළාත බටහිර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කායාීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැන.

1962 නොවැම්බර් මස 22 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිගේ. කායාීලයේදී ය.

11-1326/2

## 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත

### 277 (3) වගන්තිය යටතේ සීමාසහිත ඇස්. ඩබ්ලිව්. මැඩම්ස් සහ සමාගම නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරණ සමාගම් ආඥා පනතේ විධි විධාන යටතේ 1948 ජනවාරි 16 වැනි දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත ඇස්. ඩබ්ලිව්. මැඩම්ස් සහ සමාගම ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නො කිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සීමා සහිත ඇස්. ඩබ්ලිව්. මැඩම්ස් සහ සමාගම නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසිරුවා හරින බවත්, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනතේ 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

1962 නොවැම්බර් මස 15 දින,
කොළඹ, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේදී ය.

11-1171

---

## ප්‍රකාශනයයි

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමල නගරය සහ ග්‍රේවේට්ස් කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : බෙංගාලේ බොක්ක සහ නැගෙනහිර කට්වුකුලම්පත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මායිම.

දකුණට : තම්පලකාමම් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මායිම සහ කොට්ටියාර් බොක්ක.

නැගෙනහිරට : බෙංගාලේ බොක්ක.

බස්නාහිරට : උතුරුමැද පළාතේ දිස්ත්‍රික්ක මායිම.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර ත්‍රිකුණාමලය පශු වෛද්‍ය තැනගෙන් හෝ ත්‍රිකුණාමලය නගරය සහ ග්‍රේවේට්ස් කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායාීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 නොවැම්බර් මස 22 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීගේ කායාීලයේ දීය.

11-1385

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය හත්පත්තුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ පනව්ටිය ගම්පති කොට්ඨාශයේ වක්කුණුවල ගමේ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට : මැට්වල ගෙදර සහ අළුත්වැව ගමේ මායිම.
දකුණට : දීකිරිකැව ගමේ මායිම.
නැගෙනහිරට : එතම්පොල සහ පනව්ටිය ගමේ මායිම.
බස්නාහිරට : රනස්ගල්ල-වක්කුණුවල පාර.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර පොල්ගහවෙල පශු වෛද්‍ය තැනගෙන් හෝ දඹදෙණිය හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 නොවැම්බර් මස 22 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීගේ කාර්යාලයේ දීය.

11-1384

## ලංකා දුම්රිය අධිකාරිය

### දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම

මුහුදුබඩ දුම්රිය මාර්ගයේ කොළඹ කොටුව සහ කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථාන අතර සැ. 2 දා. 24 පුරුක් 18 දරණ ස්ථානයෙන් බ්‍රිජ් වීදිය වැටී ඇති ස්ථානය ප්‍රකෘතිමත් කිරීම සඳහා ලබන දෙසැම්බර් මස 2 වැනි ඉරිදා පෙ.ව. 6.00 සිට 3 වැනි සඳුදා පෙ.ව. 6.00 දක්වා රථ වාහන ගමනා ගමන අවුරාලීම පිණිස වසාතබනු ලැබේ.

මේ කාලය තුළදී රථ වාහන වෙනත් මාර්ගයන්ගෙන් ධාවනය කරවිය යුතුය.

11-1372/1

## ලංකා දුම්රිය අධිකාරිය

### දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම

මුහුදුබඩ දුම්රිය මාර්ගයේ මග්ගොන සහ බේරුවල දුම්රිය ස්ථාන අතර සැ. 34 දම. 61 පුරුක් 40 දරණ ස්ථානයෙන් ශාන්ත ඈනාමාවත වැටී ඇති ස්ථානය ප්‍රකෘතිමත් කිරීම සඳහා ලබන දෙසැම්බර් මස 4 වැනි අඟහරුවාදා පස්වරු 6.00 සිට රාත්‍රී 9.00 දක්වා රථ වාහන ගමනාගමනය අවුරාලීම පිණිස අර්ධ වශයෙන් වසාතබන අතර එදින රාත්‍රී 9.00 සිට පසුදින අලුයම 3.00 දක්වා සම්පූර්ණයෙන් වසා තබනු ලැබේ.

මේ කාලය තුළදී ඉතා හදිසි රථ වාහනයන්ට පමණක් මෙතැනින් ගමන් කිරීමට අවකාශ දෙනු ලැබේ.

11-1372/2

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.